# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2001 අංක 1 දරන ජාතික සමුපකාර සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2001 මාර්තු මස 21 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2001 මාර්තු මස 23 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 12.50 යි.** තැපැල් ගාස්තුව : රු. **5.25 යි.**

## 2001 අංක 1 දරන ජාතික සමූපකාර සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2001 මාර්තු මස 21 වන දින.]

එල්.ඩී.—ඕ. 20/2000.

**ජාතික සමූපකාර සංවර්ධන ආයතනය සංස්ථාගත කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2001 අංක 1 දරන ජාතික සමූපකාර සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන (මෙහි මින් මතු 'නියමිත දිනය' යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

I වන කොටස

**ජාතික සමූපකාර සංවර්ධන ආයතනය පිහිටුවීම**

2. (1) ජාතික සමූපකාර සංවර්ධන ආයතනය යන නාමයෙන් හඳුන්වනු ලබන (මෙහි මින් මතු 'ආයතනය' යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු ය. ජාතික සමූපකාර සංවර්ධන ආයතනය පිහිටුවීම.

(2) ආයතනය (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන්, අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් එය විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

3. ආයතනයට පහත දැක්වෙන බලතල ඇත්තේ ය :— ආයතනයේ බලතල.

(අ) එහි කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන සමීක්ෂණ සහ විමර්ශන පැවැත්වීම ;

(ආ) ආයතනය විසින් සපයනු ලබන සේවා සඳහා ගාස්තු සහ වෙනත් අයකිරීම් පනවා අයකිරීම ;

2—H 009932—4,400 (2000/12)

(ඈ) ආයතනයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කවර විටක වුවද චංචල සහ නිශ්චල දේපළ අත්කර ගැනීම, දැරීම, බදු දීම, උකස් කිරීම, කුලියට දීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීම ;

(ඇ) ආයතනයේ නිලධරයන් සහ සේවකයන් සඳහා රක්ෂණ, නිවාස, ශුභසාධන සහ විනෝදාංශ පහසුකම් සැපයීම ;

(ඉ) ආයතනයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන ගිවිසුම්වලට, කෙළින්ම හෝ නියෝජිතයන්ගේ මාර්ගයෙන් හෝ ඇතුළත් වීම ;

(ඊ) ආයතනයේ නිලධරයන් සහ සේවකයන්ගේ පත් කිරීම්, උසස්වීම්, පාරිශ්‍රමික ගෙවීම්, ස්ථාන මාරු, නිවාඩු, සේවයෙන් පහකිරීම් සහ ඔවුන් විෂයෙහි විනය පාලනයට අදාළ රීති ද ඇතුළුව, ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම සඳහා රීති සෑදීම ;

(උ) ආයතනයේ ප්‍රයෝජනයට නොයෙදවූ අරමුදල්, කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි සුරැකුම්පත්වල ආයෝජනය කිරීම ; සහ

(ඌ) ආයතනයේ කර්තව්‍ය ඉටු කිරීමට හිතකර හෝ ආනුෂංගික වෙනත් සියලු ක්‍රියා සිදු කිරීම.

ආයතනයේ කර්තව්‍ය.

**4.** ආයතනයේ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි වන්නේ ය :—

(අ) සමුපකාර සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියා කිරීම ;

(ආ) වෙනත් දේ අතර, නවීන තාක්ෂණික ක්‍රම උපයෝගී කර ගනිමින් සමුපකාර සංවර්ධනය පිළිබඳ පුහුණුව සැපයීම ;

(ඇ) සමුපකාර සංවර්ධනය පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම ;

(ඇ) සමුපකාර සංවර්ධනයට සම්බන්ධ ක්‍රියාකාරකම්වල නියුක්තව සිටින තැනැත්තන් අතර අන්‍යොන්‍ය ක්‍රියාකාරකම් සහ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා පහසුකම් සැලසීම ;

(ඉ) සමුපකාර සංවර්ධනයට අදාළ දත්ත රැස් කිරීම අරබයා සම්පත් මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියා කිරීම සහ රැස් කරන ලද ඒ දත්ත ප්‍රකාශනය කිරීම මගින් සංචයනය කිරීම හා පතළ කිරීම ;

(ඊ) සමුපකාර සංවර්ධනයට අදාළ විෂයයන් සම්බන්ධයෙන් ශාස්ත්‍රීය සහ පුහුණු පාඨමාලා පැවැත්වීම සහ එවැනි පාඨමාලා හදාරා නියමිත විභාගවලින් සමත්වන තැනැත්තන්ට සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා පිරි නැමීම ;

(උ) කළමනාකරණ නිපුනතා අවශ්‍ය වන සමුපකාර ව්‍යවසායයන් භාර ගෙන කළමනාකරණය කිරීම ;

(ඌ) සමුපකාර ව්‍යවසායවලට වෘත්තීය උපදෙස් සැපයීම ;

(එ) ආදර්ශ සමුපකාර ගම්මාන, ආදර්ශ සමුපකාර වෙළෙඳ මධ්‍යස්ථාන සහ ප්‍රාදේශීය මධ්‍යස්ථාන පිහිටුවීම ; සහ

(ඒ) ආයතනයේ කර්තව්‍යවලට සමාන කර්තව්‍ය ඉටු කරන, ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත පිහිටි සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

II වන කොටස

## කළමනාකරණ මණ්ඩලය

කළමනාකරණ මණ්ඩලය ආයතනයේ පාලන මණ්ඩලය විය යුතු බව.

**5.** (1) ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම, කළමනාකරණ මණ්ඩලය වෙත පැවරෙන්නේ ය.

(2) ආයතනයේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා, මේ පනතින් ආයතනය වෙත පවරා දී ඇති, පනවා ඇති හෝ භාරකොට ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය, කළමනාකරණ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීම, සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(3) තත් කාර්යය සඳහා සාදනු ලැබූ නියෝගවලට අනුකූලව සකස් කරනු ලබන ආයතනයේ සංවර්ධන සැලසුම් සහ වාර්ෂික අයවැය ලේඛනය අනුමත කිරීම කළමනාකරණ මණ්ඩලයේ කාර්යය වන්නේ ය.

කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය.

6. (1) කළමනාකරණ මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන් :—

(i) සමුපකාර සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස, තත් කාලයේ තනතුර දරන්නා හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තකු ;

(ii) සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා ;

(iii) ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ සභාපතිවරයා ;

(iv) ශ්‍රී ලංකා සමුපකාර කළමනාකරණ ආයතනයේ සභාපතිවරයා ; සහ

(v) 16 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ, ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ආ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයා" යනුවෙන් සඳහන් කරනු ලබන) පහත දැක්වෙන සාමාජිකයන් :—

(i) සමුපකාර ක්ෂේත්‍රයේ පුළුල් පළපුරුද්දක් සහ කළමනාකරණය පිළිබඳ පළපුරුද්දක් ඇති තැනැත්තන් අතුරින්, සමුපකාර සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තැනැත්තන් තිදෙනෙක් ;

(ii) උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ; සහ

(iii) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙක්.

(2) කළමනාකරණ මණ්ඩලය සඳහා පත් කරනු ලබන ඉහත සඳහන් තැනැත්තන්ගෙන් එක් අයකු කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයා ලෙස අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(3) පත් කරනු ලැබූ සෑම සාමාජිකයකු ම විසින්, මරණය, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම හේතු කොට ගෙන කලින් තම ධුරය හිස් කළ හොත් මිස, ඔහු පත් කරන ලද දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය.

(4) පත් කළ සෑම සාමාජිකයකු ම විසින්, තත් කාර්යය සම්බන්ධයෙන් අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින්, කවර වුවද අවස්ථාවක දී ධුරයෙන් ඉල්ලා අස් විය හැකි ය. එවැනි ඉල්ලා අස්වීමක් අමාත්‍යවරයා විසින් පිළිගනු ලබන දින සිට බලාත්මක වන්නේ ය.

(5) මරණය, රෝගාතුරවීම හෝ වෙනත් දුබලතාවක් හෝ මාස තුනකට නොඅඩු කාලයක් දිවයිනෙන් බැහැරව සිටීම හෝ නිසා තම ධුරයේ කටයුතු ඉටු කිරීමට යම් පත් කළ සාමාජිකයකුට නොහැකි වන අවස්ථාවක දී ඔහු වෙනුවෙන් කටයුතු කිරීමට වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(6) අමාත්‍යවරයා විසින් හේතු දක්වමින්, යම් පත් කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු වශයෙන් සිටීමට නුසුදුසුකම්.

7. යම් තැනැත්තකු, –

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ එවැන්නකු බවට පත් වේ නම් ;

(ආ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක හෝ බලපවත්නා යම් නීතියක් යටතේ සිහි විකල තැනැත්තකු බව ප්‍රකාශයට පත් කොට තිබේ නම් ;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක හෝ බලපවත්නා යම් නීතියක් යටතේ බුන්වත් හෝ බංකොලොත් බවට පත් තැනැත්තකු බවට ප්‍රකාශයට පත් කොට, නිදහස් නොකළ බුන්වත් හෝ බංකොලොත් බවට පත් තැනැත්තකුව සිටී නම් ;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක හෝ අධිකරණයක් විසින් නියම කරන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයක් විඳිමින් සිටී නම් හෝ විඳ තිබේ නම් ;

(ඉ) සමුපකාරයට අදාළ තත් කාලයේ බල පවත්නා යම් නීතියක් යටතේ වූ වරදකට වරදකරු කරනු ලැබුවහොත් හෝ වරදකරු කරනු ලැබ තිබුණහොත්,

එවැනි තැනැත්තකු කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ කටයුතු කර ගෙන යාමට නුසුදුස්සෙක් වන්නේ ය.

කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

**8.** මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන අනුප්‍රමාණවලට අනුව වූ පාරිශ්‍රමික, කළමනාකරණ මණ්ඩලයේ සියලුම සාමාජිකයන්ට හෝ යම් සාමාජිකයකුට හෝ ගෙවනු ලැබිය හැකි ය.

සභාපතිවරයා විසින් මුලසුන දැරිය යුතු බව.

**9.** (1) සභාපතිවරයා කළමනාකරණ මණ්ඩලයේ සියලුම රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටි අවස්ථාවක දී ඒ රැස්වීමේ මුලසුන දැරීමට තමන් අතුරින් කෙනකු ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(2) කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් යටත් පිරිසෙයින් සෑම මාස තුනකට වරක්වත් පවත්වනු ලැබිය යුතු ය.

(3) කළමනාකරණ මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස්දෙනකුගෙන් සමන්විත වන්නේ ය.

(4) කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම්වල දී ගනු ලබන සියලු තීරණ ඒ රැස්වීම්වලට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් ගනු ලැබිය යුතු ය. ඡන්දය සමසමව ලැබුණු අවස්ථාවක දී, සභාපතිවරයාට හෝ ඒ රැස්වීමේ මුලසුන දරන සාමාජිකයාට හෝ, තම ඡන්දයට අමතරව තීරණ ඡන්දයක් ඇත්තේ ය.

(5) මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධානවලට යටත්ව, කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් සම්බන්ධයෙන් සහ රැස්වීම්වල දී සාකච්ඡා කළ යුතු කරුණු සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය කළමනාකරණ මණ්ඩලය විසින් විධිමත් කර ගනු ලැබිය හැකි ය.

**10.** කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන්ගේ යම් පුරප්පාඩුවක් තිබුණේ වුවද ඒ නොතකා කටයුතු කර ගෙන යාමට කළමනාකරණ මණ්ඩලයට බලය ඇති අතර, කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන්ගේ යම් පුරප්පාඩුවක් තිබීම හෝ සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් පමණක්, කළමනාකරණ මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කාර්ය පරිපාටියක් අවලංගු වන්නේ යයි නොසැලකිය යුතු ය. පුරප්පාඩුවක් තිබුණේ වුවද ඒ නොතකා කළමනාකරණ මණ්ඩලය විසින් තම කර්තව්‍ය ඉටු කරනු ලැබිය හැකි බව.

**11.** ආයතනයේ මුද්‍රාව,- ආයතනයේ මුද්‍රාව.

(අ) කළමනාකරණ මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන යම් තැනැත්තකු හෝ තැනැත්තන් හෝ භාරයේ තිබිය යුතු ය ;

(ආ) කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය ;

(ඇ) කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ සාමාජිකයන් දෙදෙනා විසින් ඒ සාධන පත්‍රයේ හෝ ලේඛනයේ අත්සන් තැබිය යුතු ය.

## III වන කොටස

### අධ්‍යයන මණ්ඩලය

**12.** (1) ආයතනයේ අධ්‍යයන මණ්ඩලය, කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :— අධ්‍යයන මණ්ඩලයේ සංයුතිය.

(අ) අධ්‍යයන මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු, ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ආ) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත මගින් පිහිටුවන ලද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන විශ්ව විද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නියෝජිතයෙක් ;

(ඇ) විභාග කොමසාරිස් ජනරාල්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙක් ;

(ඈ) සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා විසින් නම් කරනු ලබන නියෝජිතයෙක් ; සහ

(ඉ) අමාත්‍යවරයාගේ මතය අනුව, කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද සහ පුහුණුව ලබා ඇත්තා වූ සමුපකාර අංශයෙන් හෝ පෞද්ගලික අංශයෙන් තෝරා ගනු ලබන තැනැත්තකු.

(2) ආයතනයේ යම් නිලධරයකු අධ්‍යයන මණ්ඩලයේ ලේකම්වරයා වශයෙන් කටයුතු කළ හැකි ය.

(3) අධ්‍යයන මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම, ඉල්ලා අස්වීම, මරණය, ධුරයෙන් ඉවත් කරනු ලැබීම හෝ ඔහු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට සුදුසුකම් ලැබුවේ යම් ධුරයක් දැරීම හේතු කොට ගෙන ද ඔහු ඒ ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ මිස, ඔහු සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් එම ධුරය දැරිය යුතු අතර, ඔහු නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

අධ්‍යයන මණ්ඩලය.

**13.** කළමනාකරණ මණ්ඩලය විසින් ගනු ලබන ප්‍රතිපත්ති තීරණවලට අනුකූලව ආයතනයේ අධ්‍යයන මණ්ඩලය විසින් පහත දැක්වෙන කර්තව්‍ය ඉටු කළ යුතු ය :—

(අ) ආයතනයේ දී පුහුණු සහ පර්යේෂණ වැඩසටහන් සකස් කිරීම ;

(ආ) ආයතනය විසින් පවත්වා ගෙන යනු ලබන පාඨමාලා සඳහා විෂයමාලා සහ කරුණු සංවර්ධනය කිරීම ;

(ඇ) ආයතනය විසින් පවත්වා ගෙන යනු ලබන විභාග සඳහා නිර්දේශ පත්‍රිකා සකස් කිරීම සහ අනුමත කිරීම, ඒ විභාග අධීක්ෂණය කිරීම සහ ආයතනයේ අධ්‍යාපන හා පුහුණු වැඩ සටහන් ඇගැයීමට අදාළ යෝජනා ක්‍රම පිළියෙල කිරීම ;

(ඈ) ආයතනය විසින් පවත්වනු ලබන විභාගවල ප්‍රතිඵල, කළමනාකරණ මණ්ඩලයේ අනුමතයට යටත්ව, නිකුත් කිරීම ; සහ

(ඉ) ශිෂ්‍යත්ව, නිල ලාංඡන සහ වෙනත් ප්‍රදානයන් ප්‍රදාන කිරීමට අදාළ විය යුතු කොන්දේසි නියම කිරීම.

අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයන් අතර පුරප්පාඩු.

**14.** (1) අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් ඇතිවුවහොත්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ බව කළමනාකරණ මණ්ඩලය වෙත දැනුම් දිය යුතු අතර, යුක්ති සහගත කාලයක් තුළ දී ඒ පුරප්පාඩුව පිරවීමට කළමනාකරණ මණ්ඩලය විසින් කටයුතු යෙදිය යුතු ය.

(2) අධ්‍යයන මණ්ඩලය විසින් කරන ලද යම් ක්‍රියාවක් හෝ කාර්ය පටිපාටියක්, අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීම හෝ ඒ මණ්ඩලයේ යම් සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් තිබීම හෝ හේතු කොට ගෙන ම පමණක් අවලංගු වන්නේ යයි නොසැලකිය යුතු ය.

අධ්‍යයන මණ්ඩලයේ රැස්වීම් යනාදිය.

**15.** (1) අධ්‍යයන මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තිදෙනකු විය යුතු ය.

(2) අධ්‍යයන මණ්ඩලයේ රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු සියලු කාරණා ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. සම සමව ඡන්දය දෙනු ලැබූ අවස්ථාවක දී ඒ රැස්වීමේ මූලසුන දරන සාමාජිකයාට, තම ඡන්දයට අමතරව, තීරණ ඡන්දයක් ඇත්තේ ය.

(3) මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධානවලට යටත්ව, අධ්‍යයන මණ්ඩලයේ රැස්වීම් සම්බන්ධයෙන් සහ ඒ රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු සම්බන්ධයෙන් අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය අධ්‍යයන මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

(4) කළමනාකරණ මණ්ඩලය විසින්, අමාත්‍යවරයා සහ මුදල් අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලබන පාරිශ්‍රමික, අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය හැකි ය.

## IV වන කොටස

## ආයතනයේ කාර්ය මණ්ඩලය

අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම ආදිය.

**16.** (1) ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් තැනැත්තකු කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා ආයතනයේ ප්‍රධාන විධායක

නිලධරයා ලෙස කටයුතු කළ යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා සේවයේ නියුක්ත කර ගැනීමට අදාළ නියමයන් සහ කොන්දේසි ආයතනය විසින් තීරණය කරනු ලැබිය යුතු අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගෙවිය යුතු පාරිශ්‍රමික, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන පරිදි, ආයතනය විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා, කළමනාකරණ මණ්ඩලයේ සාමාන්‍ය විධානවලට සහ පාලනයට යටත්ව, ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම භාරව සිටිය යුතු අතර, ආයතනය නිලධරයන් සහ සේවකයන් පාලනය කළ යුතු ය.

(3) කරුණු ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට අවස්ථාවක් ලබා දීමෙන් පසු, කළමනාකරණ මණ්ඩලය විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) අධ්‍යක්ෂ ජනරාල්වරයා මිය ගිය විට හෝ (3) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබූ විට හෝ ධුරයෙන් ඉල්ලා අස්වූ විට අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ධුරය හිස් වන්නේ ය.

(5) (3) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කරනු ලැබීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා සුදුස්සෙක් වන්නේ ය.

නිලධරයන් සහ සේවකයන්.

**17.** (1) කළමනාකරණ මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි කළමනාකරණ මණ්ඩලය විසින් සලකනු ලබන නිලධරයන් සහ සේවකයන් කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද නිලධරයන්ට සහ සේවකයන්ට කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට සහ ප්‍රමාණවලට අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි අතර කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සේවා කොන්දේසිවලට ඔවුහු යටත් විය යුතු ය.

(3) කළමනාකරණ මණ්ඩලයේ ඉල්ලීම පිට රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේ ද රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව, එවැනිම කැමැත්ත මත කළමනාකරණ මණ්ඩලය විසින්

නිශ්චය කරනු ලබන කාලයකට ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඊට හෝ ඒ සම්බන්ධයෙන් හෝ අදාළ විය යුතු ය.

(4) කළමනාකරණ මණ්ඩලයේ ඉල්ලීම පිට, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ඒ නිලධරයාගේ ද, රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව, ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිරවම පත් කරනු ලැබිය හැකි ය. රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිරවම පත් කරන ලද අවස්ථාවක දී 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට හෝ ඒ නිලධරයා සම්බන්ධයෙන් හෝ අදාළ විය යුතු ය.

(5) යම් නිශ්චිත කාලයක් රජයට සේවය කිරීමට එකඟ වී ගිවිසුමකට බැඳී සිටින යම් තැනැත්තකු ආයතනය විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ අවස්ථාවක දී ඒ තැනැත්තා විසින් ආයතනයට ඉටු කරන ලද යම් සේවා කාලයක් ඒ ගිවිසුම යටතේ ඒ තැනැත්තාගේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා රජයට කරනු ලැබූ සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) ආයතනයේ ඉල්ලීම පිට, පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ පළාත් පාලන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ සාමාජිකයාගේ හෝ නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත ඇතිව සහ, අවස්ථාවෝචිත පරිදි පළාත් පාලන සේවයේ හෝ ඒ පළාත් පාලන ආයතනයේ හෝ කැමැත්ත ද ඇතිව ආයතනය විසින් නිශ්චය කරනු ලබන යම් කාලයකට ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව, විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් හිමිකම් පිළිබඳ නියමයන් සහ කොන්දේසි ඇතුළුව, අවස්ථාවෝචිත පරිදි, පළාත් පාලන සේවය හෝ පළාත් පාලන ආයතනය සහ ආයතනය විසින් එකඟ වනු ලබන නියමයන් සහ කොන්දේසි මත ඒ සාමාජිකයා හෝ නිලධරයා හෝ සේවකයා ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලැබිය හැකි ය. පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ පළාත් පාලන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු

ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක දී, ආයතනයේ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් විය යුතු විනය පාලනයට ම ඒ සාමාජිකයා හෝ නිලධරයා හෝ සේවකයා යටත් විය යුතු ය.

(7) රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු, විසින්, ඒ සංස්ථාවේ පාලක මණ්ඩලයේ එකඟත්වය ඇතිව, කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාලයකට ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් හිමිකමට අදාළ නියමයන් සහ කොන්දේසි ඇතුළුව, ඒ සංස්ථාවේ පාලක මණ්ඩලය සහ ආයතනය එකඟ වන නියමයන් සහ කොන්දේසි මත, ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලැබිය හැකි ය.

(8) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ පිහිටුවන ලද උසස් අධ්‍යාපන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු, ආයතනයේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත ද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කැමැත්ත සහ ඒ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ කැමැත්ත ද ඇතිව, ආයතනය විසින් තීරණය කරනු ලබන කාලයකට ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලැබිය හැකි ය.

ආයතනය විසින් ස්වකීය බලතල පවරනු ලැබිය හැකි බව.

**18.** ආයතනය විසින් එහි බලතල සහ කර්තව්‍ය කිසිවක් ආයතනයේ යම් නිලධරයකු හෝ සේවකයකු හෝ වෙත පවරනු ලැබිය හැකි අතර, කළමනාකරණ මණ්ඩලයේ විධානවලට යටත්ව ඒ නිලධරයා හෝ සේවකයා විසින් ඒ බලතල ක්‍රියාත්මක කිරීම හෝ කර්තව්‍ය ඉටු කිරීම හෝ කරනු ලැබිය යුතු ය.

## V වන කොටස

## මුදල්

ආයතනයේ අරමුදල.

**19.** (1) ආයතනයට (මෙහි මින් මතු ''අරමුදල'' යනුවෙන් සඳහන් කරනු ලබන) එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) පහත දැක්වෙන මුදල් එකී අරමුදලට ගෙවනු ලැබිය යුතු ය:—

(අ) කලින් කල පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ;

(ආ) ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හෝ කර්තව්‍ය හෝ කාර්ය ඉටු කිරීමේ දී ආයතනයට ලැබෙන සියලු මුදල් ; සහ

(ඇ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත හෝ කවර වූවද ප්‍රභවයකින්, පරිත්‍යාග, ත්‍යාග, ප්‍රදාන, ආදායම්, ගාස්තු, අයකිරීම් හෝ ණය වශයෙන් ලැබෙන සියලු මුදල්.

(3) අරමුදලින් පහත දැක්වෙන ගෙවීම් කරනු ලැබිය යුතු ය:—

(අ) ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කර්තව්‍ය හෝ කාර්ය ඉටු කිරීමේ දී ආයතනය විසින් දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය වන සියලු මුදල් ;

(ආ) මේ පනතින් හෝ ඒ යටතේ හෝ ගෙවිය යුතු යයි නියමිත සියලු මුදල් ප්‍රමාණ ; සහ

(ඇ) සමුපකාර ක්ෂේත්‍රයට සම්බන්ධ රාජ්‍ය නිලධරයන්, සේවකයන්, සාමාජිකයන් සහ සමුපකාර නායකයන් පුහුණු කිරීමේ දී එම පුහුණු පාඨමාලාවට අදාළ ගාස්තු.

**20.** අමාත්‍යවරයාගේ සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව හෝ, එවැනිම එකඟත්වයක් ඇතිව දෙන ලද යම් පොදු බලයක නියමයන්ට අනුකූලව, අයිරා, ණයකර වශයෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ, ආයතනයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය මුදල් ආයතනය විසින් ණයට ගනු ලැබිය හැකි ය : මුදල් ණයට ගැනීමට ආයතනය සතු බලතල.

එසේ වුව ද, මේ වගන්තිය යටතේ ආයතනය විසින් ගනු ලැබූ ණයවලින් ගෙවීම් හිඟ තබා ඇති මුදලේ මුළු එකතුව, අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණයකට වඩා වැඩි නොවිය යුතු ය.

**21.** ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය වන්නේ ය. ආයතනයේ මුදල් වර්ෂය.

**22.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, ආයතනයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. ආයතනයේ ගිණුම් විගණනය කිරීම.

## VI වන කොටස

### පොදු විධිවිධාන

අන්තර්කාලීන විධිවිධාන.

**23.** පොල්ගොල්ලේ ශ්‍රී ලංකා සමුපකාර විද්‍යාලය විසින් හෝ ඒ සමග හෝ, පොල්ගොල්ලේ ශ්‍රී ලංකා සමුපකාර විද්‍යාලය සඳහා හෝ ඒ වෙනුවෙන් හෝ රජය විසින් නැතහොත් රජය සමග ඇති කර ගන්නා ලදුව, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ බලාත්මකව පැවති සියලු කොන්ත්‍රාත්තු සහ ගිවිසුම් ආයතනය විසින් හෝ ඒ සමග හෝ ඇති කර ගන්නා ලද කොන්ත්‍රාත්තු සහ ගිවිසුම් ලෙස ද නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පොල්ගොල්ලේ ශ්‍රී ලංකා සමුපකාර විද්‍යාලයේ පැවති බැරකම් හෝ පොල්ගොල්ලේ ශ්‍රී ලංකා සමුපකාර විද්‍යාලය සඳහා හෝ එය වෙනුවෙන් හෝ රජය විසින් එදිනට දරන ලද සියලු බැරකම්, ආයතනයේ බැරකම් ලෙස ද සලකනු ලැබිය යුතු අතර ඒවා එපරිද්දෙන් බලාත්මක කරනු ලැබිය යුතු ය.

රජයේ චංචල සහ නිශ්චල දේපල ආයතනයට ලබා දිය යුතු බව.

**24.** (1) රජයේ යම් නිශ්චල දේපළක් ආයතනයේ කාර්යයක් සඳහා අවශ්‍ය වන විටක, ඒ කාර්යය, රජයේ ඉඩම් ආඥා පනතේ 6 වන වගන්තිය යටතේ විශේෂ ප්‍රදානයක් හෝ බද්දක් හෝ වශයෙන් ඒ දේපළ දෙනු ලැබිය හැකි කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, ඒ දේපළ විශේෂ ප්‍රදානයක් හෝ බද්දක් හෝ වශයෙන් ආයතනයට දීමකට එකී වගන්තියේ විධිවිධාන අදාළ වන්නේ ය.

(2) ආයතනයේ කාර්යයක් සඳහා රජයේ යම් චංචල දේපළක් අවශ්‍ය වන විටක, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ඒ දේපළෙහි සන්තකය සහ පාවිච්චිය ආයතනය වෙත මාරු කිරීම හෝ සතුකර දීම හෝ කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, රජයේ චංචල දේපළක් සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ එවැනි නියමයක්, ඒ දේපළෙහි පාලනය දරන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මිස නොකරනු ලැබිය යුතු ය.

ආයතනයේ කාර්යය සඳහා පුද්ගලික දේපළ අත්කර ගැනීම.

**25.** (1) ආයතනයේ යම් නිශ්චිත කාර්යයක් සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම අවශ්‍ය වන අවස්ථාවක දී, ඒ කාර්යය සඳහා ඒ දේපළ අවශ්‍ය බව අමාත්‍යවරයා විසින් ගැසට්

පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ඒ යෝජිත අත්කර ගැනීම අනුමත කරනු ලැබූ විට, ඒ දේපළ පොදු කාර්යයක් සඳහා අවශ්‍ය දේපළක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ඒ දේපළ අත්කර ගෙන ආයතනය වෙත පවරා දෙනු ලැබිය හැකි ය.

(2) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ආයතනයේ කාර්යයක් සඳහා යම් කිසි නිශ්චල දේපළක් අත්කර ගැනීම සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් මුදලක් ආයතනයේ අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ හෝ කළමනාකරණ මණ්ඩලයේ විධානය යටතේ කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

**26.** (1) (අ) මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ආයතනයට විරුද්ධව ; හෝ

(ආ) මේ පනත යටතේ හෝ කළමනාකරණ මණ්ඩලයේ විධානය යටතේ හෝ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලයේ යම් සාමාජිකයකුට හෝ නිලධරයකුට හෝ සේවකයකුට හෝ නියෝජිතයකුට විරුද්ධව

අපරාධ හෝ සිවිල් නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) ආයතනය විසින් හෝ ආයතනයට විරුද්ධව හෝ යම් අධිකරණයක පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ආයතනය විසින් දරන ලද යම් වියදමක් ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ආයතනයට ගෙවන ලද හෝ ආයතනයට ලැබුනු යම් නඩු ගාස්තුවක් ආයතනයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ කළමනාකරණ මණ්ඩලයේ විධානය යටතේ හෝ කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව යම් අධිකරණයක පවරන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ තැනැත්තා විසින් කරන ලද යම් වියදමක් ඒ

ක්‍රියාව කරන ලද්දේ සද්භාවයෙන් යයි අධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත්, ඒ වියදම ඒ තැනැත්තා විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අයකරගෙන නොමැත්තේ නම්, ආයතනයේ අරමුදලින් ඒ තැනැත්තාට ඒ වියදම ගෙවනු ලැබිය යුතු ය.

ආයතනයේ සාමාජිකයන් නිලධරයන් සහ සේවකයන් රජයේ නිලධරයන් ලෙස සැලකිය යුතු බව.

**27.** කළමනාකරණ මණ්ඩලයේ සියලුම සාමාජිකයන් සහ ආයතනයේ සියලුම නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව හා එහි කාර්යය සඳහා රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව ආයතනය උපලේඛන ගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

**28.** ආයතනය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛන ගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

කළමනාකරණ මණ්ඩලය විසින් ආයතනය වෙත වාර්තා සැපයිය යුතු බව.

**29.** ආයතනයේ එක් එක් මුදල් වර්ෂය අවසාන වීමෙන් පසු මාස හයක් තුළ දී ඒ වර්ෂයේ ආයතනයේ කටයුතු විස්තර කෙරෙන වාර්තාවක් කළමනාකරණ මණ්ඩලය විසින් අමාත්‍යවරයා වෙත යවනු ලැබිය යුතු ය. ඒ වාර්තාවේ පිටපතක් අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු ය.

කළමනාකරණ මණ්ඩලය වෙත සාමාන්‍ය හෝ විශේෂ විධාන දීමට අමාත්‍යවරයා සතු බලතල.

**30.** (1) ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විශේෂ හෝ සාමාන්‍ය විධාන අමාත්‍යවරයා විසින් ලිඛිතව කළමනාකරණ මණ්ඩලය වෙත දෙනු ලැබිය හැකි ය. එවැනි සෑම විධානයක්ම කළමනාකරණ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

(2) ආයතනයේ කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට අවශ්‍ය වන තොරතුරු ඔහු වෙත ලිඛිතව සපයන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල කළමනාකරණ මණ්ඩලයට විධාන කරනු ලැබිය හැකි අතර, එවැනි විධානවලට අනුකූල වීම කළමනාකරණ මණ්ඩලයේ කාර්යය වන්නේ ය.

නියෝග.

**31.** (1) නියෝග සෑදීමට මේ පනතින් නියමිත හෝ බලය දෙනු ලැබූ හෝ නියම කළ යුතු යයි මේ පනතින් නියමිත හෝ යම් කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ දින සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් යම් පසු දිනයක සිට ඒ නියෝගය ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලැබූ සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි තාක් ඉක්මනින් පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරන ලද්දක් සේ සලකනු ලැබිය යුතු නමුත් ඒ නියෝගය යටතේ ඊට පූර්වයෙන් කරන ලද යම් ක්‍රියාවකට අගතියක් ඉන් සිදු නොවිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් පරිච්ඡින්න කරන ලද්දේ යයි සලකනු ලබන දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**32.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**33.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතේ –

"පාලක මණ්ඩලය" යන්නෙන්, රාජ්‍ය සංස්ථාවක් සම්බන්ධයෙන් යෙදී ඇති විට ඒ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම පැවරී ඇති, අධ්‍යක්ෂ මණ්ඩලය හෝ වෙනත් කවර වූ ආකාරයකින් විස්තර කරනු ලබන කවර වුවද මණ්ඩලයක් ඉන් අදහස් වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහා නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන, ඉටු කරනු ලබන හෝ සිදු කරනු ලබන බලතල, කාර්යය හෝ කර්තව්‍යවලට අනුරූපී හෝ සමාන හෝ බලතල හෝ කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට හෝ සිදු කිරීමට යම් නීතියක් මගින් හෝ ඒ යටතේ හෝ ඇති කරනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ වෙනත් යම් බලාධිකාරයක් ඊට ඇතුළත් වේ ;

"ප්‍රධාන විධායක නිලධරයා" යන්නෙන්, උසස් අධ්‍යාපන ආයතනයක් සම්බන්ධයෙන් යෙදී ඇති විට, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ ඊට දී ඇති අර්ථයම ඊට ඇත්තේ ය ;

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII අ පරිච්ඡේදය යටතේ පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ ; තවද,

"විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතින් පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.